# ජාතික කියවීමේ මාසය - 2017 ඔක්තෝම්බර්

ඔබගේ පොත්පත් කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අදහසින් සහ පුස්තකාල භාවිතය දිරිගැන්වීමේ අරමුණින් යුක්තව **2017 ඔක්තෝබර් ජාතික කියවීමේ මාසය** තුළදී පොත්පත් කියැවීම පිළිබඳ තරගයක් පැවැත්වීමට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පුස්තකාලය කටයුතු කර ඇත.

පහත සඳහන් ඡේදය විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පුස්තකාලයේ තිබෙන පොතකින් උපුටා ගන්නා ලද්දකි.

"වන සතුන් බහුලව පැමිණෙන ජලාශයක් සෙවීම සඳහා මිනිසුන් දෙදෙනෙකු පිටත්කළ සින්නයියා ඔහුගේ අත්දැකීම් පිළිබඳ කතන්දර ඇද බාන්නට පටන් ගත්තේය. "මහත්තයකු මෙහේ නැවතී හිටපු දවසක හැන්දෑවේ මා රාත්‍රී කෑමට සතකු හෙළ ගන්න කැලයට ගියා. අපේ වාඩිය තිබුණේ ලොකු වැවක් ළඟ. වාඩියේ කෝකියා හාල් හෝදමින් ඉන්නවා මා දැක්කා. මා වැව වටේම හොඳට සෝදිසියෙන් බැලුවා. ඊළඟට වැව් බැම්ම දිගේ මගේ ඇස් යැව්වා. මගෙන් අඩි කීපයක් ඈතින් හිටියේ මොකෙක් ද? ලොකු දළ දෙකක් තිබුණු දැවැන්ත ඇතෙක්! ඌ හොඩ උස්සලා කුංච නාද කළා! ඊට පස්සේ තමයි මා පුදුම දෙයක් දැක්කේ! එක එක ප්‍රමාණයේ අලි නිමක් නැතිව හැම පැත්තේන් ම වැවට බහින්න පටන් ගත්තා. මා හතළිස් පහක් වෙනකං ගැණලා ඊට පස්සේ ගණන් කිරීම නතර කළා. මුවන් තරමට පුංචි හුරතල් අලි පැටවුන් සිටියා! අල්ලලා මිරිකා ගන්න හිතෙනවා! හුඟක් මහලු අලියෙකුත් උන් අතර හිටියා. ඌ රැනේ නායක යා! අනෙක් අලින් ඌට කන්න දේ ගෙනත් දුන්නා. ඒ තරමට ඌ දුර්වල යි. එත් උගේ දළ දෙක! බලන්න එපායැ! මේං මේවාගේ දෙපැත්තට විහිදුවා හිස මහත් උදාර විලාසකින් පසු පසට ගැස්සීය." ඒ කා දළවල ගජ මුතු තිබුණ ඇතෙක්! දළ දෙකේ මුතු තිබෙන ඇතා හිස හොළවන විට "සිලි - සිලි" ගාලා සද්දේ ඇහෙනවා."

මෙම ඡේදය ඇතුලත් පොතේ නම, කර්තෘ සහ ප්‍රකාශන ආයතනය පිළිබඳ විස්තර සමග ඔබගේ නම, ශාඛාව/ අංශය සහ පුස්තකාල සාමාජික බලපත්‍ර අංකය ඇතුළත් කර 2017 **නොවැම්බර් 03** දිනට පෙර පුස්තකාලයාධිපති වෙත භාර දෙන්න.

ජයග්‍රහණය කරනු ලබන පාඨකයාට වටිනා ත්‍යාගයක් පිරිනැමේ.

කියවන්න ! ජයගන්න !